# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

## PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ප්‍රවෘත්ති කර්තෘ / සංස්කාරක,

### මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නාමල් තලංගම මහතාට තර්ජනය කර රාජකාරියට බාධා කිරීම තරයේ හෙළා දකිමු.

ඕනෑම රටක පවත්වන මැතිවරණයක සුජාත භාවයට අදාළ මූලිකම සාධකය වන්නේ එම රටේ සුදුසුකම් සහිත පුරවැසියන් සියළුම දෙනාගේ නම් ඇතුලත් නිවැරදි ඡන්ද නාම ලේඛනයක් තිබේද යන්නයි. ඒ සඳහා සෑම වර්ෂයකම ඡන්ද දායකයන්ට ලියාපදිංචිය තහවුරු කිරීමට හා අලුතින් ලියාපදිංචියට ඉඩකඩ හිමි වේ. එහෙත් මෙම ඡන්ද නාමලේඛන මැතිවරණ ක්‍රියාවලියෙන් බැහැර ජනප්‍රිය පාසල්වලට දරුවන් ඇතුලත් කිරීම සඳහා පදිංචිය සනාථ කිරීමේ ලේඛනයක් ලෙස භාවිත කෙරෙන බැවින් සමහර පිරිස් තම ලියාපදිංචිය පාසල් ආසන්නයේ සිදුකර ගැනීමට උත්සාහ දරයි.

මෙවැනි පසුබිමක් තුළ අද දින ( 2017.10.02) මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා ඡන්ද නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ හිමිකම් පරීක්ෂණයක් සිදු කරමින් සිටින මොහොතක දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට කඩා වැදුනු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභානායක අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මහතාගේ සම්බන්ධීකරණ ලේකම් වරයෙකු යැයි තමාව හඳුන්වා දුන් වරුණ ලියනගේ නැමැත්තෙකු නාමල් තලංගම මහතාගේ රාජකාරියට බාධා කරමින් ඔහුට තර්ජනය කර පහරදීමට උත්සාහ දරා ඇත. වාර්තා වන අන්දමට වරුණ ලියනගේ තර්ජනය කර තිබෙන්නේ එම ප්‍රදේශයේ පදිංචි නොමැති තම ආධාරකරුවකුගේ නමක් ප්‍රධාන පාසලක් අසල ලියාපදිංචි කරන ලෙසයි.

එමෙන්ම අදාළ පුද්ගලයා අවධාරණය කර ඇත්තේ තමා මේ රටේ තුන්වන පුරවැසියාගේ ලේකම්වරයෙකු බැවින් ඔහුගේ අවශ්‍යතා ඉෂ්ඨ වන පරිදි නියෝජ්‍ය කොමසාරිස් වරයා කටයුතු කළ යුතු බවයි. මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ස්වාධීනව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් රජය විසින් සැපයිය යුතු මොහොතක මෙවැනි ක්‍රියාකාරකම් අප තරයේ හෙළා දකින අතර අදාළ පුද්ගලයන්ට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කරන ලෙස අප පොලිස්පති තුමාගෙන් ඉල්ලා සිටිමු.

එමෙන්ම මෙවැනි උද්දච්ච පුද්ගලයින් ළඟ තබා ගැනීම ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍ය තුමාට කිසිසේත්ම යහපත් නොවනු ඇත. එබැවින් අමාත්‍ය තුමා ගනු ලබන ක්‍රියාමාර්ග දෙස ද අප බලා සිටිමු.

නාමල් තලංගම මහතා පසුගිය මැතිවරණ කිහිපයකදීම තම ජීවිතය ද නොසළකා නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා පෙනී සිටි නිලධාරියෙකු බවද මෙහිදී අපි අවධාරණය කරනු කැමැත්තෙමු.

ස්තූතියි.

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

Scanned by CamScanner